# ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2019

# தேசிய கல்வி ஆணைக்குழு

வருடாந்த அறிக்கை

2019

# National Education Commission

Annual Report

2019

නො. 126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - No.126, Nawala Road, Nugegoda.

| පටුන | අංකය |
|---|---|
| 1. හැඳින්වීම | 02-03 |
| 2. කාර්යයන් හා කර්තව්‍යයන් | 04 |
| 3. කොමිෂන් සභාවේ සංයුතිය | 05 |
| 4. ඉලක්ක හා කාර්ය සාධන දර්ශක | 06 |
| 5. කාර්ය සාධන සාරාංශය - 2019 | 07-18 |
| 6. අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2019 | 19 |
| 7. ඇමුණුම් | |
| ඇමුණුම I - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2019 | 20 |
| ඇමුණුම II - මූල්‍ය ප්‍රකාශය - 2019 | 21 |
| ඇමුණුම III - කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු | 22 |
| ඇමුණුම IV - විගණකාධිපති වාර්තාව - 2019 | 23-29 |
| ඇමුණුම V - ආයතනික ව්‍යුහය | 30 |

## හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

තරුණයන් පිළිබඳ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදය ප්‍රකාරව අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් පොදු එකගතාවක් ලැබීම අරමුණු කෙරෙන "අධ්‍යාපන ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් ජාතික කොමිසමක්" පිහිටුවීමේ දැඩි අවශ්‍යතාව පිළිගෙන ඇත. "එබඳු කොමිසමක් මගින් වහාම දස අවුරුදු සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය ආරම්භ කළ යුතු අතර 1991 වසර තුළ එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කටයුතු ඇරඹිය යුතුය" යන තරුණයන් පිළිබඳ ජනාධිපති  කොමිෂන් සභා වාර්තාවේ සඳහන් ඉහත කරුණු පාදක කරගෙන හා වරින් වර ඇතිවන දේශපාලන වෙනස්කම් නිසා කෙරෙන බලපෑම් වලින් බැහැර වූ අධ්‍යාපන ක්‍රමයක් සඳහා ස්ථිර හා නිශ්චිත ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම හඳුනාගෙන ඒ සඳහා 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව පිහිටුවා තිබුණි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ 2(1) වන වගන්තිය සහ 2 (3) වන වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන නිර්දේශ ඇතුළත් වාර්තාව පාදක කරගෙන අධ්‍යාපනයේ සියලු අංශ සම්බන්ධයෙන් වගකිවයුතු සියලු අධිකාරි හා ආයතන විසින් අනුකූලතාවක් දැක්විය යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය ජනාධිපතිවරයා විසින් කලින් කල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතුය.

කොමිෂන් සභා පනතේ 4 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ සංයුතියට අධ්‍යාපනය, පරිපාලනය, කළමනාකරණය යන ක්ෂේත්‍රවල හැකියාවක් ඇති තැනැත්තන් 10 දෙනෙකු සහ නිල බලයෙන් පත්වන සාමාජිකයන් 05 දෙනෙකු ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන අතර පනතේ 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන පූර්ණ කාලීන සභාපතිවරයා සහ උප සභාපතිවරුන් දෙදෙනකුන්ගෙන් ද කොමිෂන් සභාව සමන්විත වේ.

**දැක්ම**

ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කෙරෙන්නාවුත් සියළු අභියෝගයන්ට මුහුණ දීම සඳහා යොදා ගත හැකි බව සහ සාධාරණත්වය සහතික කෙරෙන්නාවුත් පරිපූර්ණ අධ්‍යාපනයක් සැමට ලබාදෙන පෘථුල ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම.

**මෙහෙවර**

අධ්‍යාපන පද්ධතියේ සියළු අංශ නොකඩවා පවත්වාගෙන යාම සහතික කෙරෙන්නාවුත් ශ්‍රී ලංකාවේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමේ හැකියාව ඇත්තාවුත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

## කාර්යයන් හා කර්තව්‍යයන්

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලුම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

## කොමිෂන් සභාවේ සංයුතිය

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. දැනට කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 28 දෙනෙකුගෙන් සමන්විතය.

## ඉලක්ක හා කාර්ය සාධන දර්ශක - 2019

| ක්‍රියාකාරකම | | අරමුණු | කාර්ය සාධන දර්ශක |
|---|---|---|---|
| 01 | පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම. | දැනට පවතින පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශන ප්‍රතිපත්තිය නැවත සමාලෝචනය හා නව ප්‍රශස්ත ප්‍රතිපත්ති රාමුවක් යෝජනා කිරීම. | කෙටුම්පත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනක් පැවතීම. |
| 02 | පාසල් පද්ධතිය නැවත සමාලෝචනය සහ පාසල් පද්ධතිය පිළිබඳ ප්රතිපත්තියක් සම්පාදනය කිරීම. | පාසල් පද්ධතියෙහි ගැටළු ආමන්ත්‍රණය කිරීම’ | සමීක්ෂණයක් සිදු කිරීම හා සමාලෝචනයෙහි වාර්තාවක් පැවතීම. |
| 03 | පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම. | පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් හඳුන්වා දීම. | පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනක් පැවතීම. |
| 04 | තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියෙහි පිටපත් මුද්‍රණය කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | යෝජිත ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම තුළින් වැඩ ලෝකයේ අවශ්‍යතාවය සහතික කිරීම. | ප්‍රතිපත්ති ප්‍රකාශනය මුද්‍රණය කිරීම හා යෝජිත ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. |
| 05 | උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය සම්පූර්ණ කිරීම. | උසස් අධ්‍යාපන පද්ධතියෙහි පවත්නා ගැටළු ආමන්ත්‍රණය සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම් හඳුන්වා දීම. | උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනක් පැවතීම. |
| 06 | ප්‍රවෘත්ති විවරණිකාවක් ප්‍රකාශයට පත්කිරීම. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදුකරනු ලබන අධ්‍යාපනික ප්‍රතිපත්ති සම්පාදනය පිළිබඳ පාර්ශවකරුවන්/මහජනතාව දැනුවත් කිරීම. | ප්‍රවෘත්ති විවරණිකාව මුද්‍රණය කිරීම හා පාර්ශවකරුවන්/මහජනතාව වෙත බෙදා හැරීම. |
| 07 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ ප්‍රලේඛන මධ්‍යස්ථානය/පුස්තකාලය සකස් කිරීම’ | ප්‍රශස්ත ලෙස ස්ථාපිත ප්‍රලේඛන මධ්‍යස්ථානයක් තිබීම. | ප්‍රශස්ත මට්ටමේ ප්‍රලේඛන මධ්‍යස්ථානය ස්ථාපිත කර පැවතීම. |

## කාර්ය සාධන සාරාංශය - 2019

### හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

1. පවත්නා වැඩසටහන් සමාලෝචනය හා විශ්ලේෂණය තුළින් රටේ අධ්‍යාපන ප්‍රතිපත්ති ඇගයීම.
2. වර්තමාන අවශ්‍යතා අනුව අධ්‍යාපනික ප්‍රතිපත්ති යෝජනා යාවත්කාලීන කිරීම.
3. පවතින ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් සම්බන්ධව සිදුකරන සමාලෝචන, විශ්ලේෂණ, තක්සේරු කිරීම් හා නවීකරණය මත පදනම්ව ජනාධිපතිතුමා වෙත අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව නිර්දේශ ලබාදීම.

ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් පරිදි ක්ෂේත්‍ර තුනක් යටතේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ස්ථාවර කමිටු තුනක් ස්ථාපිත කර ඇත.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
2. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.
3. තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව.

සෑම ස්ථාවර කමිටුවක්ම රාජ්‍ය හා පෞද්ගලික අංශයේ අදාළ ක්ෂේත්‍ර නියෝජනය කරන විද්වතුන් 15ක් 20 අතර සාමාජිකයින් පිරිසකගෙන් සමන්විත වේ.

2019 වර්ෂය සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් වල කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කළ හැකිය.

**1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය.**

**1.1 පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම.**

පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම හෝ 2016 වර්ෂයේ දී සම්පාදනය කරන ලද සාමාන්‍ය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති මාලාවේ අන්තර්ගතව ඇති පාසල් වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළ පරිච්ඡේදය නැවත සමාලෝචනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව අවබෝධ කර ගන්නා ලදී. ශ්‍රී ලංකාවේ පිහිටි බ්‍රිතාන්‍ය කවුන්සිලය විසින් සිය මූල්‍ය හා තාක්ෂණික දායකත්වය මෙම කාර්යය සඳහා ලබා දෙන ලදී.

පාසල් වල විදුහල්පතිවරුන්, වෘත්තීය මාර්ගෝපදේශනයේ නියුතු ගුරුවරු, පාසල් ශිෂ්‍යයින්, වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළව කටයුතු කරනු ලබන රාජ්‍යය හා රාජ්‍ය නොවන ආයතන වල නිලධාරීන්, ව්‍යවසායකයින්, තරුණ සංවිධාන වෙතින් ප්‍රතිපත්ති සම්පාදනයේ දී අවශ්‍ය උපදේශනය පහත පරිදි ලබා ගැනීමට කටයුතු කරන ලදී.

**(i) ආරම්භක සම්මන්ත්‍රණය**

ශ්‍රී ලංකාවේ පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධව දැනට පවතින ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලය හා එක්ව 2019 ජනවාරි මස 24 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී ආරම්භක සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. මෙම සම්මන්ත්‍රණයේ මූලික අරමුණ වූයේ පාසල්

වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළව කටයුතු කරන ආයතන හඳුනාගැනීමත් ඔවුන්ගේ කාර්යභාරය හඳුනාගැනීමත්ය.

මේ සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීමේ අධිකාරිය, ජාතික වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන මධ්‍යස්ථානය, අධ්‍යාපන අමාත්‍යාංශය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය, ජාතික අධ්‍යාපන ආයතනය, මිනිස් බල හා රැකී රක්ෂා කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික යොවුන් සේනාංකය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, විශ්වවිද්‍යාල, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පාසල්, ජාතික තරුණසේවා සභාව, අධ්‍යාපන විද්‍යා පීඨ, ශ්‍රී ලංකා වෘත්තිකයන් සංවිධානය කිරීමේ සංගමය නියෝජනය කරමින් නිලධාරීන් සහභාගී වූහ.

**(ii) පාසල් වෘත්තීය මාර්ගෝපදේශන ඒකක නිරීක්ෂණ අධ්‍යයනය**

පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 06/2013 හා 2013.01.15 දිනැති චක්‍රලේඛයෙහි උපදෙස් ක්‍රියාවට නංවන්නේ ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවෙහි නිලධාරීන් බස්නාහිර, සබරගමුව හා වයඹ යන පළාත් තුනෙහි තෝරාගත් පාසල් 10 ක සංචාරය කරන ලදී.

යම් පමණකට සාම්පලය සාධාරණීකරණය කිරීම පිණිස පාසල් පද්ධතියෙහි සාමාන්‍ය ලක්ෂණ, පාසල් අතර ඇති විෂමතාවන්, පාසල්වල පිහිටීම ආදී කරුණු සැලකිල්ලට ගනිමින් පාසල් 10හි නියැදිය තෝරාගන්නා ලදී. ඒ අනුව, විදුහල්පතිවරුන්, වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ගුරුභවතුන්, 13 වසර ශිෂ්‍යයන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරන ලදී. මෙම සම්මුඛ පරීක්ෂණය ව්‍යුහගත ප්‍රශ්නාවලි 03ක් පදනම්ව සිදු කරන ලදී.

කිසිදු පාසලක වෘත්තීය මාර්ගෝපදේශනයට අදාළ ඒකකයක් ක්‍රියාත්මක නොවූ අතර 2013.01.15 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 06/2013 මගින් ලබා දී ඇති උපදෙස් කිසිවක් ක්‍රියාත්මකව නොතිබුණි.

අධ්‍යයනයට ලක් වූ පළාත් තුනෙහි (බස්නාහිර, සබරගමුව හා වයඹ) පාසල් 10 හි විදුහල්පතිවරු සමග 2019 ජූලි මස 15 වන දින ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දී රැස්වීමක් පවත්වන ලදී. එහිදී, පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනයට අදාලව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013.01.15 දිනැතිව නිකුත්කරන ලද 06/2013 චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව මෙන්ම එය ක්‍රියාත්මක කිරීමේ දී මතුවන්නාවූ ගැටළු පිළිබඳව අදහස් ලබාගන්නා ලදී.

මීට අමතරව, පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය හා ඉහත චක්‍රලේඛය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා පාසල් 40 ක විදුහල්පතිවරුන් හා වෘත්තීය මාර්ගෝපදේශන උපදේශන ගුරුවරුන් සඳහා වැඩමුළු දෙකක් පිළිවෙලින් 2019 ජූලි මස 23 හා 26 දිනයන්හි දී ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන ලදී.

**(iii) දැනුම හුවමාරු කිරීමේ තෙදින වැඩමුළුව**

එක්සත් රාජධානියේ පවත්නා වෘත්තීය මාර්ගෝපදේශන පද්ධතිය සම්බන්ධව හඳුන්වා දීම මගින් එරට භාවිතාවන ප්‍රශස්ත භාවිතාවන් හඳුනාගැනීම පිණිස දැනුම හුවමාරු කරගැනීමේ වැඩමුළුවක් 2019 මාර්තු මස 20 සිට 22 දක්වා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය කවුන්සිලයේ සහයෝගීතාවයෙන් කොළඹ මුවන්පික් (Movenpick) හෝටලයේ දී පවත්වන ලදී.

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, ජාතික වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන මධ්‍යස්ථානය, අධ්‍යාපන අමාත්‍යාංශය, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික මානව සම්පත් සංවර්ධන කවුන්සිලය, ජාතික අධ්‍යාපන ආයතනය, මිනිස්බල හා රැකී රක්ෂා කටයුතු දෙපාර්තමේන්තුව, ජාතික යොවුන් සේනාංකය, ශ්‍රී ලංකා පදනම් ආයතනය, විශ්වවිද්‍යාල, දිස්ත්‍රික ලේකම් කාර්යාල, පාසල්, ජාතික තරුණ සේවා සභාව, අධ්‍යාපන විද්‍යාපීඨ, වෘත්තීකයින් සංවිධානය කිරීමේ සංගමය නියෝජනය කරමින් අදාළ නිලධාරින් සහභාගී වූහ.

එක්සත් රාජධානියේ ලිවර්පූල්හි කැරිය කනෙක්ට් (Career Connect) ආයතනය නියෝජනය කරමින් පැමිණි වෘත්තීය මාර්ගෝපදේශන විශේෂඥයින් දෙපලක් ද වැඩසටහනේ සම්පත් දායකත්වය ලබාදෙමින් සහභාගී වූහ.

**(iv) සේවයෝජක නියෝජිතයින්ගේ අදහස් ලබාගැනීම**

පාසල් අධ්‍යාපනය හා පවතින රැකියා වෙළඳ පළ අතර ඇති නොගැලපීම් හා පාසල් වෘත්තීය මාර්ගෝපදේශනයේ දී සේවායෝජකයින්ගේ සහභාගීත්වය හඳුනාගැනීම පිණිස ශ්‍රී ලංකාවේ ප්‍රධාන පෙලේ පිළිගත් පෞද්ගලික අංශයේ සමාගම් හි සේවායෝජකයින්ගේ හා නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් 2019 මැයි මස 10 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී වැඩමුළුවක් පවත්වන ලදී.

**(v) තරුණ සංවිධානවල නියෝජිතයින් වෙතින් අදහස් ලබාගැනීම**

තවද, වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ප්‍රතිපත්ති ප්‍රකාශනය සම්පාදනය සඳහා අදහස් ලබාගැනීම පිණිස රාජ්‍ය හා රාජ්‍යය නොවන ආයතන නියෝජනය කරන තරුණ කොටස්වල සහභාගීත්වයෙන් 2019 මැයි මස 15 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයෙහි දී හමුවක් පවත්වන ලදී.

**(vi) ප්‍රධාන කණ්ඩායම් රැස්වීම් (Core-Group meetings)**

ප්‍රථම ප්‍රධාන කණ්ඩායමේ සාකච්ඡාව 2019 අප්‍රේල් මස 25 දින වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ප්‍රතිපත්තිය කෙටුම්පත් කිරීම ආරම්භ කිරීම පිණිස ජාතික තරුණ සේවා සභාව, මිනිස්බල හා රැකියා කටයුතු අමාත්‍යාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය වැනි ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී.

ඊට අමතරව වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධයෙන් පවත්වන ලද වැඩමුළු/සාකච්ඡා/සම්මන්ත්‍රණවල දී පාර්ශවකරුවන් වෙතින් ලබාගන්නා ලද අදහස් සැලකිල්ලට ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා කෙටුම්පත් කිරීම ආරම්භ කිරීම පිණිස ප්‍රධාන කණ්ඩායමේ දෙවන හා තුන්වන සාකච්ඡා 2019 අගෝස්තු 27 හා සැප්තැම්බර් 05 යන දෙදින දී පවත්වන ලදී.

පාර්ශවකරුවන් වෙතින් ලබාගන්නා ලද කරුණු හා අදහස් සැලකිල්ලට ගනිමින් සම්පාදනය කරන ලද පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය සම්බන්ධ ප්‍රතිපත්ති යෝජනා කෙටුම්පත 2019 නොවැම්බර් 11 දින පැවති 7 වන කොමිෂන් සභාවේ 296 වන කොමිෂන් සභා රැස්වීම වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි ප්‍රතිපත්ති යෝජනා සම්බන්ධව අවසාන එකගතාවයකට පැමිණීම හා ඒවා ක්‍රියාත්මක කිරීම පිණිස මාර්ග සැලැස්මක් පිළියෙල කිරීම අරමුණු කොටගෙන 2019 දෙසැම්බර් 04 දින කොළඹ Movenpick හෝටලයේ දී වැඩමුළුමක් පවත්වන ලදී.

එක්සත් රාජධානියේ කැරියර් කනෙක්ට් හි සම්පත්දායකයෙකු ද මෙම වැඩමුළුව සඳහා සහභාගී විය.

## 1.2 පාසල් පද්ධතිය පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම

2016 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුව තුළ පාසල් පද්ධතිය පිළිබඳ පරිච්ඡේදයක් නොමැති බැවින් පාසල් පද්ධතිය පිළිබඳ ප්‍රතිපත්ති රාමුවක් සැකසීමේ අවශ්‍යතාවය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අවබෝධ කර ගන්නා ලදී.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සම්බන්ධයෙන් ගැටළු රාශියක් පවතී. පාසල් අතර පවතින විෂමතාවය පාසල් පද්ධතිය තුළ පවතින ප්‍රධාන ගැටළුවකි. ඊට අමතරව, නාගරික ප්‍රදේශවල ඇති ඇතැම් ද්විතීයික පාසල් ග්‍රාමීය ප්‍රදේශවල පිහිටි පාසල්වලට වඩා ඉතා ඉහළ මට්ටමක පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස, ග්‍රාමීය දරුවන් විශාල සංඛ්‍යාවක් ග්‍රාමීය පාසල්වල සිට නාගරික පාසල් වෙත පැමිණේ. මධ්‍ය විද්‍යාල පද්ධති ආකෘතිය අතහැර දැමීම හේතුවෙන් ග්‍රාමීය ප්‍රදේශවල ද්විතීයික අධ්‍යාපන පහසුකම් සහ අවස්ථාවන් ප්‍රමාණවත් ලෙස වැඩිදියුණු වී නොමැත.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ පළාත් වල අදාළ නිලධාරීන් සමඟ 2018 නොවැම්බර් මස ආරම්භයේ දී වැඩමුළුවක් පවත්වන ලදී.

ඉහත තත්ත්වය අනුව, දැනට පවතින පාසල් පද්ධතිය පිළිබඳව සමාලෝචනය කිරීම සඳහා සබරගමුව පළාත කේන්ද්‍ර කර ගනිමින් සමීක්ෂණ අධ්‍යයනයක් සිදු කරන ලදී.

අධ්‍යයනයට අදාළව දත්ත එක්රැස් කිරීම සඳහා සබරගමුව පළාතේ විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් අතර ප්‍රශ්නාවලි බෙදා දෙන ලදී.

ඊට අමතරව පාසල් පද්ධතියේ පවත්නා ගැටලු පිළිබඳව අවබෝධයක් ඇති බැවින් ඒ පිළිබඳව උපදෙස් ලබාගනු පිණිස ජාතික මට්ටමින් පළාත් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ ද, ප්‍රාදේශීය මට්ටමින්, බස්නාහිර හා සබරගමු පළාත්වල අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ ද, සබරගමුව පළාතේ තෝරාගත් පාසල් දහයක විදුහල්පතිවරුන් සහ වෙනත් පාර්ශවකරුවන් සමඟ ද පහත පරිදි වැඩමුළු / සාකච්ඡා පවත්වන ලදී.

(i) 2018.11.05 දින ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පරිශ්‍රයේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡාවක් පැවැත්වීය. දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හැර අනෙකුත් අධ්‍යක්ෂවරුන් අට දෙනා ඒ සඳහා සහභාගී වූහ.

(ii) 2018.11.23 දින රත්නපුර කලාප අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡාවක් ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත්විණ.

(iii) සබරගමුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡාවක් 2018.12.18 දින රත්නපුර දී පැවැත්විය.

(iv) බස්නාහිර පළාතේ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සමඟ සාකච්ඡාවක් 2018.12.20 දින ජාතික අධ්‍යාපන ආයතනයේ දී පැවැත්විණ.

(v) පාසල් පද්ධතිය පිළිබඳ ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සම්බන්ධයෙන් සබරගමුව පළාතේ ගුරුවරුන් සමඟ වැඩමුළුවක් ඇහැලියගොඩ මෙනේරිපිටිය ගුරු පුහුණු මධ්‍යස්ථානයේ දී 2019.04.03 වන දින පැවැත්විණ.

(vi) පාසල් පද්ධතියෙහි දැනට පවත්නා තත්ත්වය සහ ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2019 ජුනි මස 13 වන දින රැස්වීමක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දී පැවැත්විණ. අධ්‍යාපන අමාත්‍යාංශයේ; දෙමළ පාසල්, මුස්ලිම් පාසල්, වතු පාසල්, ජාතික පාසල් සහ පෞද්ගලික පාසල් භාර අධ්‍යක්ෂකවරුන්හට මේ සඳහා ආරාධනා කරන ලදී. මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ද මදුසා පාසල් සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීම සඳහා මෙම රැස්වීමට සහභාගී විය.

(vii) 2019 ජුනි 19 සහ 25 යන දෙදින තුළ දී පාසල් පද්ධතියේ වර්තමාන තත්ත්වය සහ ගැටළු සාකච්ඡා කිරීම සඳහා ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් සමඟ වෙන වෙනම රැස්වීම් දෙකක් මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ දී පවත්වන ලදී.

සබරගමුව පළාතේ පාසල් පද්ධතිය සමාලෝචනය කිරීමේ අධ්‍යයනයට අදාළව සැකසූ යෝජනා ඇතුළත් ලේඛනයෙහි අන්තර්ගත නිර්දේශ පිළිබඳ සාරාංශයක් කොමිෂන් සභාවේ සාමාජිකයින් වෙත පිළිගන්වන ලදී.

ඉහත වාර්තාව සකස් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින පාසල් පද්ධතියට අදාළ සියලුම පර්යේෂණ, නිබන්ධනයන්, අධ්‍යයන වාර්තා යනාදිය අධ්‍යයනය කරන ලදී. ඊට අමතරව අදාළ Organization for Economic Co-operation and Development (OECD) සහ ලෝක බැංකු වාර්තා ද අධ්‍යයනය කර ඇත.

### 1.3 පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති රාමුවක මග පෙන්වීමක් නොමැතිව මෙරට පෙර පාසල් අධ්‍යාපනය ක්‍රියාත්මක වන බැවින් මේ පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසීමේ අවශ්‍යතාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන තිබුණි. එබැවින්, පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රශස්ත ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම සඳහා සියලුම පාර්ශවකරුවන් සමඟ සංවාදයක් ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදි. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය සඳහා අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදෙමින් යුනිසෙෆ් ආයතනය ඊට සහයෝගීතාවය පළ කරන ලදි.

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා සැලකිල්ලට ගත යුතු කරුණු හඳුනාගැනීම වෙනුවෙන් වූ මූලික සාකච්ඡාවක් අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, පෙර පාසල් කටයුතු සම්බන්ධ පළාත් නිළධාරීන්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවෙහි සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින් සහ පෞද්ගලික පෙර පාසල් නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් 2018.06.07 දින ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

තව ද, අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන නිළධාරීන්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, පෙර පාසල් අධ්‍යාපනය පිලිබඳ ප්‍රවීණයින්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්, යුනිසෙෆ් සහ පෞද්ගලික පෙර පාසල් නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා අදහස් හා නිර්දේශයන් ලබාගැනීම සඳහා වූ දෙවන වැඩමුළුව ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී 2018.10.12 දින පවත්වන ලදී.

එම වැඩමුළුවේදී, (i) ළමා ලේකම් කාර්යාලය (ii) අධ්‍යාපන අමාත්‍යාංශය (iii) බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව (iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මුල් ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව (v) ජාතික අධ්‍යාපන ආයතනය (vi) ලයිසියම් ජාත්‍යන්තර පාසල යන ආයතන විසින් පෙර පාසල් අධ්‍යාපන විෂයෙහි නියැලෙන එක් එක් බලධාරීන්ගේ කාර්යභාරය සහ වගකීම් හඳුනා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

මීට අමතරව, එම වැඩමුළුවේ දෙවන සැසියේ දී මූලික ක්ෂේත්‍ර පහක් (05) යටතේ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සඳහා වන නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීම පිණිස කණ්ඩායම් පහක් (05) පත් කරන ලදි.

තව ද, අදාළ ක්ෂේත්‍රයේ විවිධ පාර්ශවයන් වෙතින් වැඩිදුරටත් අදහස් හා යෝජනා ලබාගැනීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දී පහත සඳහන් විශේෂ සාකච්ඡා/වැඩමුළු ආදිය ද පවත්වන ලදි.

(i) පෙර පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගීත්වය පිළිබඳ සාකච්ඡා කිරීම පිණිස ජාතික ළමා පදනම, වැවිලි මානව සංවර්ධන භාරය සහ පෞද්ගලික පෙර පාසල් නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් 2018.11.13 දින පැවැති සාකච්ඡාව

(ii) පෙර පාසල් අධ්‍යාපනයට අවශ්‍ය ඉගෙනුම් පරිසරය පිළිබඳව හඳුනාගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් වන ළමා ලේකම් කාර්යාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික ළමා පදනම, මුල් ළමාවිය සංවර්ධන නිළධාරීන් සහ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් 2018.12.13 දින පැවැති සාකච්ඡාව

(iii) පෙර පාසල් ගුරු සංවර්ධනය පිළිබඳ ගුරු පුහුණු ආයතන නිළධාරීන් සමග 2018.12.21 දින පැවැති සාකච්ඡාව

(iv) පෙර පාසල් අධ්‍යාපනය සම්බන්ධයෙන් පළාත් කාර්යයභාරය පිළිබදව පෙර පාසල් අධ්‍යාපනයට අදාළ පළාත් අධ්‍යක්ෂකවරුන් සමග 2019.01.11 දින පැවැති සාකච්ඡාව

ඉහත විශේෂ සාකච්ඡා හා වැඩමුළු මගින් ලබාගත් අදහස් හා යෝජනා ඇතුළත් කර සම්පාදනය කළ පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති කෙටුම්පත පිළිබදව අදහස් ලබාගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් කොමිෂන් සභාව ඇතුලු රාජ්‍ය ආයතන නිළධාරීන්, පෙර පාසල් කටයුතු සම්බන්ධ පළාත් නිළධාරීන්, පෙර පාසල් අධ්‍යාපනය පිළිබද ප්‍රවීණයින්, සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්, යුනිසෙෆ්, සේව් ද චිල්ඩ්රන් වැනි රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලික පෙර පාසල් නියෝජිතයින් ආදී පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ දී 2019.04.09 දින පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ බුද්ධි කලම්භන වැඩමුළුවක් පවත්වන ලදී.

අවසන් වාර්තාව සකස් කිරීමට පෙර කෙටුම්පත් කරන ලද ප්‍රතිපත්ති ප්‍රකාශනය පිළිබද තවදුරටත් අදහස් හා යෝජනා ලබාගැනීම සඳහා පෙර පාසල් අධ්‍යාපනය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික පාර්ශවකරුවන්ගේ; අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය, ජාතික ළමා ආරක්ෂණ අධිකාරිය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, ජාතික අධ්‍යාපන ආයතනය, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව, මුදල් කොමිෂන් සභාව, පෙර පාසල් සම්බන්ධ පළාත් නිලධාරීන්, පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ විශේෂඥයින්, සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු සාමාජිකයින්, යුනිසෙෆ්, සේව් ද චිල්ඩ්රන් ආදී පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් ප්‍රතිපත්ති අධ්‍යයන කේන්ද්‍රයේ දී 2019.07.18 දින නැවත වැඩමුළුවක් පවත්වන ලදී.

අවසන් ප්‍රතිපත්ති ප්‍රකාශනය සඳහා 2019.07.24 දින පැවැති සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටු රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත.

2019.08.08 දින පැවැති 293 වැනි ජාතික අධ්‍යාපන කොමිෂන් සභා රැස්වීමේ දී මෙම ප්‍රතිපත්ති ප්‍රකාශනය මුද්‍රණය කිරීමට හා අතිගරු ජනාධිපතිතුමා වෙත එය පිළිගැන්වීම සඳහා අනුමැතිය ද ලබා දී ඇත.

පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය 2019.10.15 දින ජනාධිපති කාර්යාලයේ දී අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගැන්වීම සිදු කරන ලදි. පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම පිණිස වන අමාත්‍ය මණ්ඩල සංදේශයක් ද අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

## 2. උසස් අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

### 2.1 උසස් අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවත්නා ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා මගපෙන්වීම අරමුණු කොට උසස් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනා මාලාවක් සම්පාදනය කිරීමට මුලපුරන ලදී.

උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ පවතින ගැටළු හා ඉදිරි ප්‍රවනතා හඳුනාගැනීම පිණිස දැනට පවතින ප්‍රතිපත්ති සමාලෝචනය සඳහා අධ්‍යනයක් සිදු කිරීම පිණිස පර්යේෂණ කණ්ඩායම් අටක් පත් කරන ලදී.

ඒ අනුව, හඳුනාගන්නා ලද පර්යේෂණ අධ්‍යයන මාතෘකා 08ක් සඳහා යොමු කිරීමේ අනුදේශයන් (TOR) සකස් කරන ලදී. ඒවා නම්, (i) පාලනය, මූල්‍යය හා සම්පත් කළමනාකරණය (ii) උසස් අධ්‍යාපනය සඳහා ප්‍රවේශය, ශිෂ්‍ය ඇතුළත්වීම හා නව විෂයයන් හා විෂය ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම (iii) වෘත්තීය මාර්ගෝපදේශනය හා උපදේශනය (Iv) ශිෂ්‍ය සුභසාධනය හා විනය (v) පශ්චාද් උපාධි අධ්‍යාපනය හා පර්යේෂණ (vi) පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපනය සහ රාජ්‍යය හා පෞද්ගලික අංශයේ සම්බන්ධතාවය (vii) රාජ්‍ය සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවල ගුණාත්මකභාවය සහතිකකරණය හා ප්‍රතීතනය (vii) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සංවර්ධනය (viii) පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන හා පෞද්ගලික ආයතන සහ රජය අතර සම්බන්ධතාව.

ප්‍රතිපත්ති සම්පාදනයට අදාළව පහත සඳහන් රැස්වීම් හා වැඩමුළු පවත්වන ලදී.

(i) ඉහත මාතෘකා සම්බන්ධව අදාළ කණ්ඩායම් විසින් ලබාදුන් අන්තර් මාධ්‍යය වාර්තාවන් (Interning Reports) සමාලෝචනය කිරීම සඳහා 2018 අගෝස්තු මස 03 හා 13 වන දිනයන්හි දී වැඩමුළු දෙකක් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

(ii) උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති වාර්තාව සකසා අවසන් කිරීම සඳහා 2018 නොවැම්බර් 17 හා 26 යන දිනයන්හි දී සමාලෝචන මණ්ඩලය සමග වැඩමුළු දෙකක් පවත්වන ලදි.

(iii) ප්‍රතිපත්ති ප්‍රකාශනය තවදුරටත් වැඩි දියුණු කිරීම පිණිස අදහස් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා නියෝජිතයින්, උපකුලපතිවරු, පශ්චාද් උපාධි ආයතන වල අධ්‍යක්ෂකවරුන් හා විශ්වවිද්‍යාලවල පීඨාධිපතිවරුන් ආදී පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් වූ වැඩමුළුවක් 2019 ජුනි මස 10 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී පවත්වන ලදී.

දෙවන වැඩමුළුව 2019 ජුලි මස 01 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේ දී විශ්වවිද්‍යාල ආචාර්ය සංගමයේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ, පෞද්ගලික අංශයේ සහ උසස් අධ්‍යාපන ආයතනවල නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ.

2019 අගෝස්තු 08 වන දින පැවැති 293 වන කොමිෂන් සභා රැස්වීමේ දී ලද අනුමැතිය ප්‍රකාරව උසස් අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉංග්‍රීසි පිටපත මුද්‍රණය කරන ලදී.

## 3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

### 3.1 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ දැනට පවත්නා ප්‍රතිපත්ති රාමුව 2009 වර්ෂයේ දී ප්‍රකාශයට පත් කරන ලද්දකි. පසුගිය දශකය තුළ මෙරට හා ජාත්‍යන්තරය තුළ සිදු වූ සමාජ, ආර්ථික හා තාක්ෂණික සංවර්ධනය හේතුවෙන් වැඩ ලෝකයේ අවශ්‍යතාවයන් සහතික කරනු වස් දැනට පවතින ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම හා නව ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම අවශ්‍ය විය.

ඒ අනුව, 2017 වර්ෂයේ දී ආරම්භක වැඩමුළුවක් පවත්වමින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස් කිරීම ආරම්භ කරන ලදී. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා කණ්ඩායම් 09ක් පත්කළ අතර අදාළ වාර්තා 2018 ජුලි මස පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලද වැඩමුළුවක දී ඉදිරිපත් කරන ලදී. සංස්කරණය කරන ලද අවසන් වාර්තා සඳහා තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශය ලබාගෙන ඇත.

යෝජිත ප්‍රතිපත්ති ප්‍රකාශය සකස් කිරීමේදී පහත සඳහන් ක්ෂේත්‍ර 09ක් පිළිබඳව අවධානය යොමුකර ඇත. ඒවා නම්, (i) කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයට ප්‍රවේශවීම වර්ධනය කිරීම. (ii) භෞතික, මූල්‍ය සහ මානව සම්පත්වල උපරිම භාවිතය. (iii) පාඨමාලා අතිපිහිතවීම (Overlap) අවම කිරීමට පුහුණු වැඩසටහන් පරිමේයකරණය කිරීම. (iv) කාර්මික හා වෘත්තීය පුහුණු අධ්‍යාපන වැඩසටහන් වල අදාළත්වය හා ගුණාත්මකභාවය. (v) කර්මාන්තය, සේව්‍යයන්, සේවකයන් සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව අතර අන්තර් සබඳතාවය. (vi) සාමාන්‍ය අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය සමඟ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුවෙහි අන්තර් සම්බන්ධතාවය. (vii) කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුවේ අධ්‍යයන සහ පරිපාලන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සහ වෘත්තීය සංවර්ධනය. (viii) අවදානම් තත්වයට මුහුණ පෑ සහ ප්‍රතිලාභ

නොලබන පිරිස් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණුව සඳහා ප්‍රවේශ වීම. (ix) තොරතුරු එක්රැස් කිරීම, බෙදා හැරීම සහ වෘත්තීය මාර්ගෝපදේශනය.

තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ මුද්‍රිත ප්‍රතිපත්ති ප්‍රකාශය 2019 මැයි මස 03 වන දින ජනාධිපති කාර්යාලයේදී අතිගරු ජනාධිපතිතුමා වෙත පිළිගන්වන ලදී. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්තිය ජාතික ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත්කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2019 අගෝස්තු 20 වන දින ලබා දෙන ලදී.

2019 ඔක්තෝබර් 10 වන දින BMICH හිදී කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගු කාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගීතාවයෙන් කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් ප්‍රතිපත්ති යෝජනා පිළිබඳව අදාළ ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී.

උක්ත සම්මන්ත්‍රණයෙන් අනතුරුව කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගු කාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම, සමුපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් විසින් 2019 ඔක්තෝබර් 11 වන දින එම අමාත්‍යාංශයේ දී විශේෂ රැස්වීමක් කැඳවන ලදුව 2020 වර්ෂයේ සිට කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සාකච්ඡා කරන ලදී.

තවද, ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් යෝජිත ප්‍රතිපත්ති යෝජනා මත පදනම්ව කාර්මික හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු (TVET) සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ සභාපතිත්වයෙන් යුතු උපදේශක කමිටුවක් පත් කරන ලද අතර එම කමිටුවේ රැස්වීම් කිහිපයක් දැනටමත් පවත්වා ඇත. මීට අමතරව, නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති සියලුම පුහුණු ආයතන නියෝජනය වන පරිදි නිලධාරීන්ගෙන් සමන්විත විවිධ ක්ෂේත්‍ර යටතේ වන ක්‍රියාකාරී කමිටු පහක් ද මේ සඳහා පත් කරන ලදී.

2019.12.31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|
| ලේකම් | 1 | 1 | - |
| ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 5 | 2 | 3 |
| නියෝජ්‍ය ලේකම් / සහකාර ලේකම් | 1 | 1 | - |
| ගණකාධිකාරී | 1 | - | 1 |
| ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී | 4 | 2 | 2 |
| පරිපාලන නිලධාරී | 1 | 1 | - |
| වැඩසටහන් නිලධාරී (මුදල්) | 1 | - | 1 |
| වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 4 | 2 | 2 |
| වැඩසටහන් නිලධාරී (තොරතුරු) | 1 | 1 | - |
| සංවර්ධන නිලධාරීන් | 4 | - | 4 |
| කළමනාකරණ සහකාර | 10 | 7 | 3 |
| රියදුරු | 6 | 5 | 1 |
| ආරක්ෂක නියාමක | 2 | 2 | - |
| කාර්යාල සහයක | 4 | 4 | - |
| **මුළු** | **45** | **28** | **17** |

**මානව සම්පත් සංවර්ධනය**

ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණතාවයෙන් හෙබි කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වේ. ඒ සඳහා පවත්නා සීමිත පුරප්පාඩු සියල්ල පිරවීමට ද මේ වන විට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

මානව සම්පත් සංවර්ධනය සඳහා සකස් කරන ලද සැලැස්මකට අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සියලුම කාර්ය මණ්ඩලය සඳහා හඳුනාගත් අවශ්‍යතාවයන් අනුව ධාරිතා සංවර්ධනය/පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීම අත්‍යවශ්‍යවේ.

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය / පුහුණුව පිළිබඳ තොරතුරු - 2019**

| | වැඩසටහනෙහි නම | සහභාගී වූ නිලධාරීන්ගේ නම | තනතුර | කාලය |
|---|---|---|---|---|
| 1 | අධ්‍යාපනය සම්බන්ධ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | ඩබ්.ඒ.ඩී.ටී. ජයසිංහ මහත්මිය | වැඩසටහන් නිලධාරී (තොරතුරු) | 2019 සැප්තැම්බර් සිට |
| 2 | අධ්‍යාපනය සම්බන්ධ පශ්චාද් උපාධි ඩිප්ලෝමාව | ඩබ්.ඩී.ඒ. කේ. දමයන්ති මහත්මිය | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 2015 ජුනි සිට 2019 ජනවාරි දක්වා |
| 3 | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය, නියාමනය හා සැලසුම් කිරීම | ජී.එල්. නිමේෂා මහත්මිය | කළමනාකරණ සහකාර | ජුලි 24,25 සහ 26 |
| 4 | දත්ත විශ්ලේෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා<br>ඩබ්.ඒ.ඩී.ටී. ජයසිංහ මහත්මිය<br>එච්.ඕ.සී. ගුණසේකර මෙනවිය | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (තොරතුරු)<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | 2018.09.30 සිට (මාස 04) |
| 5 | රාජ්‍ය ආයතන වල විනය කළමනාකරණය තුන්දින වැඩමුළුව | එච්.එෆ්.සී.ජේ. ෆොන්සේකා මහතා | පරිපාලන නිලධාරී | අගෝස්තු 05,06 සහ 07 |
| 6 | රජයේ ආයතන සඳහා උසස් මයික්‍රොසොෆ්ට් එක්සෙල් කුසලතා වැඩසටහන | එම්.ඒ. පිගුරාඩෝ මහතා<br>එම්.ඒ.ඩී. ධනංජනී මහත්මිය | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | අගෝස්තු 27 සහ 28 |
| 7 | උසස් සංඛ්‍යාලේඛන විශ්ලේෂණය (Advance Statistics Analysis) | සී.ආර්. මයුරන් මහතා | වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | සැප්තැම්බර් 04,05 සහ 06 |
| 8 | රජයේ වැටුප් ලේඛන පද්ධතිය පිළිබඳ පුහුණුව | එම්.ඒ.ඩී. ධනංජනී මහත්මිය<br>ජී.එල්. නිමේෂා මහත්මිය | කළමනාකරණ සහකාර<br>කළමනාකරණ සහකාර | ඔක්තොම්බර් 02,03 සහ 04 |
| 9 | ඵලදායී ඉදිරිපත් කිරීමේ කුසලතා පිළිබඳ වැඩමුළුව | ආර්.ඒ.ආර්. කරුණාරත්න මහතා<br>සී.ආර්. මයුරන් මහතා | ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී<br>වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්) | නොවැම්බර් 21 සහ 22 |
| 10 | ඉන්වෙන්ටරි හා වත්කම් කළමනාකරණය | එම්.ඒ. පිගුරාඩෝ මහතා | කළමනාකරණ සහකාර | ඔක්තෝබර් 27,28 සහ 29 |
| 11 | සේවක නිවාඩු, නියාමනය සහ හදිසි අනතුරු වන්දි | එම්.ඒ. පිගුරාඩෝ මහතා | කළමනාකරණ සහකාර | සැප්තැම්බර් 17 |

## අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2019

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

2019.12.31 දිනට අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය

| වැය විෂය අංකය | කාර්යය | වෙන්කළ මුදල (රු.) | ඉතිරිකිරීම | වැය කළ මුදල (රු.) | ඉතිරිය (රු.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | **පුනරාවර්තන වියදම්** | 42,733,000.00 | 45,000.00 | 39,769,513.74 | 2,918,486.26 | 93.07 |
| | වැටුප | 26,200,000.00 | | 23,424,122.40 | 2,775,877.60 | 89.41 |
| 1001 | වැටුප් හා වේතන | 19,800,000.00 | | 18,382,814.90 | 1,417,185.10 | 92.84 |
| 1002 | අතිකාල හා වෙනත් දීමනා | 1,100,000.00 | | 1,099,876.95 | 123.05 | 99.99 |
| 1003 | වෙනත් දීමනා | 5,300,000.00 | | 3,941,430.55 | 1,358,569.45 | 74.37 |
| | **ගමන් වියදම්** | 335,000.00 | | 333,390.70 | 1,609.30 | 99.52 |
| 1101 | දේශීය | 225,000.00 | | 224,113.45 | 886.55 | 99.61 |
| 1102 | විදේශීය | 110,000.00 | | 109,277.25 | 722.75 | 99.34 |
| | **සැපයීම්** | 2,100,000.00 | | 2,049,847.00 | 50,153.00 | 97.61 |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා | 250,000.00 | | 248,597.20 | 1,402.80 | 99.44 |
| 1202 | ඉන්ධන හා ලිහිසි තෙල් | 1,600,000.00 | | 1,557,851.88 | 42,148.12 | 97.37 |
| 1203 | නිල ඇඳුම් | 100,000.00 | | 93,397.92 | 6,602.08 | 93.40 |
| 1205 | වෙනත් දීමනා | 150,000.00 | | 150,000.00 | - | 100.00 |
| | **නඩත්තු වියදම්** | 1,380,000.00 | | 1,344,045.16 | 35,954.84 | 97.39 |
| 1301 | වාහන | 980,000.00 | | 973,961.00 | 6,039.00 | 99.38 |
| 1302 | යන්ත්‍ර සහ උපකරණ | 350,000.00 | | 349,562.00 | 438.00 | 99.87 |
| 1303 | ගොඩනැගිලි | 50,000.00 | | 20,522.16 | 29,477.84 | 41.04 |
| | **කිවිසුම්ගත සේවා** | 11,955,000.00 | 45,000.00 | 11,855,372.48 | 54,627.52 | 99.17 |
| 1401 | ප්‍රවාහනය | 600,000.00 | | 600,000.00 | - | 100.00 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,200,000.00 | | 1,199,775.88 | 224.12 | 99.98 |
| 1403 | විදුලිය හා ජලය | 865,000.00 | 45,000.00 | 793,392.44 | 26,607.56 | 91.72 |
| 1404 | බදු කුලිය | 7,323,000.00 | | 7,322,680.00 | 320.00 | 100.00 |
| 1409 | වෙනත් | 1,967,000.00 | | 1,939,524.16 | 27,475.84 | 98.60 |
| | **මාරුකිරීම්** | 763,000.00 | | 762,736.00 | 264.00 | 99.97 |
| 1502 | විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ (අතිරේක) | 763,000.00 | | 762,736.00 | 264.00 | 99.97 |
| | **මූලධන වියදම්** | 9,350,000.00 | 2,337,500.00 | 4,553,885.11 | 2,458,614.89 | 48.70 |
| | **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය** | 100,000.00 | | - | 100,000.00 | - |
| 2002 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 100,000.00 | | - | 100,000.00 | - |
| | **මූලධන වත්කම් අත්පත් කරගැනීම** | 1,150,000.00 | | 585,275.00 | 564,725.00 | 50.89 |
| 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,000,000.00 | | 447,000.00 | 553,000.00 | 44.70 |
| 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 150,000.00 | | 138,275.00 | 11,725.00 | 92.18 |
| | **ධාරිතා සංවර්ධනය** | 1,300,000.00 | | 209,300.00 | 1,090,700.00 | 16.10 |
| 2401 | පුහුණුව හා සංවර්ධනය | 1,300,000.00 | 900,000.00 | 209,300.00 | 190,700.00 | 16.10 |
| | අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ වැඩසටහන් | 5,000,000.00 | | 2,322,651.97 | 2,677,348.03 | 46.45 |
| 2507-1 | පර්යේෂණ හා සංවර්ධනය | 5,000,000.00 | 1,387,500.00 | 2,322,651.97 | 1,289,848.03 | 46.45 |
| | අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ වැඩසටහන් | 1,800,000.00 | | 1,436,658.14 | 363,341.86 | 79.81 |
| 2507-2 | පර්යේෂණ හා සංවර්ධනය | 1,800,000.00 | 50,000.00 | 1,436,658.14 | 313,341.86 | 79.81 |
| | **එකතුව** | 52,083,000.00 | 2,382,500.00 | 44,323,398.85 | 5,377,101.15 | 85.10 |

ඇමුණුම I

**ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2019**

| විස්තරය | ප්‍රමාණය | වටිනාකම (රු) |
|---|---|---|
| මුද්‍රණ යන්ත්‍ර | 3 | 39,000.00 |
| පරිගණක මූසිකය | 5 | 3,500.00 |
| ඡායා පිටපත් යන්ත්‍රය | 2 | 366,850.00 |
| ඡායා පිටපත් යන්ත්‍රය - රැම් | 1 | 12,900.00 |
| ඩෙස්ක්ටොප් පරිගණක - රැම් | 1 | 7,500.00 |
| ලැප්ටොප් බැටරි | 1 | 9,500.00 |
| ලැප්ටොප් දෘඩ තැටිය | 1 | 7,750.00 |
| ලැප්ටොප් සංදර්ශකය | 1 | 9,500.00 |
| දුරකථන PAPX පද්ධතිය | 1 | 118,800.00 |
| දුරකථන | 7 | 9,975.00 |
| **එකතුව** | | **585,275.00** |

ඇමුණුම II

## මූල්‍ය ප්‍රකාශය - 2019

ඒසීඒ-පී

### 2019 දෙසැම්බර් 31 දිනට
### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | සත්‍ය<br>2019<br>රු. | <br>2018<br>රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 44,974,918 | 43,749,643 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 1,838,351 | 2,346,589 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 638,728 | 1,162,384 |
| **මුළු වත්කම්** | | **47,451,997** | **47,258,616** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| ශුද්ධ වත්කම් | | 1,808,351 | 2,309,039 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 44,974,918 | 43,749,643 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 30,000 | 37,550 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 638,728 | 1,162,384 |
| **මුළු වගකීම්** | | **47,451,997** | **47,258,616** |

පිටු අංක 01 සිට 53 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 54 සිට 61 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ............................ | ............................ | ............................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 28-02-2020 | දිනය : 27-02-2020 | දිනය : |

N.H.M. Chitrananda
Secretary
Ministry of Education
"Isurupaya" Pelawatta,
Battaramulla.

එච්. පී. අප්සරා කල්දේරා
ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
අංක 126, නාවල පාර, නුගේගොඩ.

එස්. එම්. ආරියරත්න ද අල්විස්
නියෝජ්‍ය ලේකම්
ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
126, නාවල පාර, නුගේගොඩ.

2

**ඇමුණුම III**

## කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු

**හත්වන කොමිෂන් සභාව** 2017.09.07 වන දින පත්ව ඇති අතර එහි ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2017 ඔක්තෝම්බර් මස19 වන දින පවත්වන ලදී. 7 වන කොමිෂන් සභාවේ නිල කාලය 2019 දෙසැම්බර් 05 වන දිනෙන් අවසන් විය.

**කොමිෂන් සභාවේ සාමාජිකත්වය:**

**සභාපති** : මහාචාර්ය ඩබ්.අයි. සිරිවීර මහතා

**උප සභාපති** : ආචාර්ය ජී.බී. ගුණවර්ධන මහතා - උප සභාපති (ප්‍රතිපත්ති)

ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා - උප සභාපති (සැලසුම්)

**නිල බලයෙන් පත්වන සාමාජිකයින් :**

| | |
|---|---|
| සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | මහාචාර්ය මොහාන් ද සිල්වා මහතා |
| සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව | මහාචාර්ය දයන්ත විජේසේකර මහතා |
| අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත | මහාචාර්ය ආර්.යූ. හල්වතුර මහතා |
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත | ඒ.එන්. හපුගල මහතා |
| පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිත | එච්.ටී. කමල් පත්මසිරි මහතා<br>නයනා නාතවිතාරණ මහත්මිය<br>(2019.07.04 දින සිට) |

**පත් කරන ලද සාමාජිකයින් :**

පූජ්‍ය අකුරටියේ නන්දනායක ස්වාමීන්වහන්සේ

මහාචාර්ය කේ. කන්දසාමි මහතා

මහාචාර්ය එම්.ඒ. නුහුමාන් මහතා

මහාචාර්ය ඩී.ඒ. තන්ත්‍රිගොඩ මහතා

ආචාර්ය එස්.බී. ඒකනායක මහතා

ආචාර්ය මල්ලිකා කරුණාරත්න මිය

වී.බී.පී.කේ. වීරසිංහ මිය

**ඇමුණුම IV**

## විගණකාධිපති වාර්තාව - 2019

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඊඩියු/බී/එන්ඊසී/එෆ්ඒ/2019    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2020 මැයි 29 දින

NATION... 09 JUN 2020 SRI LANKA

සභාපති

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

1.2 **තත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන අතර

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

##### 1.6.1.1 අග්‍රිම ගිණුමේ ශේෂය

භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රු.637,183.38 ක් වූ අතර කොමිෂන් සභාවේ පොත් අනුව එය රු.638,728 ක් විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 50(ii) හා (iii) ඡේද අනුව හැකිතාක් සම්පූර්ණයෙන් නිවැරදිව සහ සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් වාර්ෂික අයවැය වෙන් කිරීම , පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන, මු.රෙ.66 මාරුකිරීම් සහ අනිවාර්ය ඉතිරිකිරීම් වලින් පසු ශුද්ධ වෙන්කිරීම රු.49,745,500 ක් ද ශුද්ධ වියදම රු.44,360,118 ක් ද වූයෙන් රු.5,385,382 ක අධි ඇස්තමේන්තු කිරීමක් නිරීක්ෂණය විය. ඉන් සියයට 35 සිට සියයට 100 දක්වා වූ මූලධන ප්‍රතිපාදනවල ඉතිරි කිරීම නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් දෙකකට අදාලව අනිවාර්ය ඉතිරිකිරීම් වලින් පසුව වූ ඉක්මවීම පිළිවෙලින් රු.25,775 ක් හා රු.86,658 ක් විය.

### 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පුනරාවර්තන වැය විෂයයන් 3 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවූ බැරකම් ප්‍රමාණය රු.770,404 ක් විය.

### 2.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබීම සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

NAOSL

3 මෙහෙයුම් සමාලෝචනය හා කාර්යසාධනය

ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම්,වියදම්,වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් මෙහෙයුම් සමාලෝචනය, තිරසාර සංවර්ධනය, යහපාලනය හා මානව සම්පත් කළමනාකරණයට අදාල විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ඉදිරිපත් කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ලැබේ.

P.H.

එම්.අයි.පුෂ්පා හේමමාලි
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

5

**ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**ශීර්ෂය 12**

| අංකය | විගණන නිරීක්ෂණ | පිළිතුර |
|---|---|---|
| 1.6 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම | |
| 1.6.1 | මූල්‍ය තතත්වය පිළිබඳ ප්‍රකාශය | |
| 1.6.1.1 | අග්‍රිම ගිණුමේ ශේෂය | |
| | භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම ශේෂය භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව රු. 637,183.38 ක් වූ අතර කොමිෂන් සභාවේ පොත් අනුව එය රු. 638,728 ක් විය. | ආයතනික බැංකු ගිණුමේ මුදල් තැන්පත් කිරීමේ දී වැරදීමකින් රු. 1,545.00 ක් වැඩියෙන් තැන්පත් කිරීම නිසා මෙම වෙනස ඇතිවිය. |
| 2 | මූල්‍ය සමාලෝචනය | |
| 2.1 | වියදම් කළමනාකරණය | |
| (අ) | මුදල් රෙගුලාසි 50(ii) හා (iii) ඡේද අනුව හැකිතාක් සම්පූර්ණයෙන් නිවැරදිව සහ සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන සැලකිල්ලෙන් යුතුව ඇස්තමේන්තු පිළියෙල නොකිරීම හේතුවෙන් වාර්ෂික අයවැය වෙන් කිරීම, පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන මු.රෙ 66 මාරුකිරීම් සහ අනිවාර්ය ඉතිරිකිරීම් වලින් පසු ශුද්ධ වෙන්කිරීම රු. 49,745,500 ක් ද ශුද්ධ වියදම රු. 44,360,118 ක් ද වූයෙන් රු. 5,385,382 ක අධි ඇස්තමේන්තු කිරීමක් නිරීක්ෂණය විය. ඉන් සියයට 35 සිට සියයට 100 දක්වා වූ මූලධන ප්‍රතිපාදනවල ඉතිරි කිරීම් නිරීක්ෂණය විය. | මුදල් අරපරිස්සමින් වියදම් කිරීම සම්බන්ධයෙන් 2019 වසර තුළ නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛයන්හි (අංක 04/2019, 05/2019, 07/2019) සඳහන් උපදෙස් අනුව සියළු වියදම් පාලනයකින් යුතුව දැරීමට කටයුතු කරන ලදී. තවද, එහි උපදෙස් අනුව එකී චක්‍රලේඛ නිකුත් කරන අවස්ථාවේ අරඹා නොතිබූ ප්‍රසම්පාදන කටයුතු ද ක්‍රියාත්මක නොකරන ලදී.<br><br>එමෙන්ම, පූර්ව පාසල් අධ්‍යාපනය පිළිබද ප්‍රතිපත්තිය සකස් කිරීම වෙනුවෙන් UNICEF ආයතනයෙන් හා පාසල් පාදක වෘත්තීය මාර්ගෝපදේශන ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා බ්‍රිතාන්‍ය කවුන්සිලයෙන් ලද අනුග්‍රහ දායකත්වය හේතුවෙන් ඒ සඳහා වියදම් කිරීමට නියමිතව තිබූ මුදල් ඉතිරි විය. |
| (ආ) | ප්‍රාග්ධන වැය විෂයයන් දෙකකට අදාලව අනිවාර්ය ඉතිරිකිරීම් වලින් පසුව වූ ඉක්මවීම පිළිවෙලින් රු. 25,775 ක් හා රු. 86,658 ක් විය. | |
| 2.2 | බැරකම් හා බැදීම්වලට එළඹීම | |
| | පුනරාවර්තන වැය විෂයයන් 3 කට අදාලව ශුද්ධ ප්‍රතිපාදන ඉක්මවූ බැරකම් ප්‍රමාණය රු. 770,404 ක් විය. | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු වෙනුවෙන් කණිෂ්ඨ කාර්යමණ්ඩලය සඳහා ගෙවීමට සිදු වූ අතිකාල වියදම් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය අනුව ලබා ගත් අතිරේක ප්‍රතිපාදන භාවිතා කර ඇත. |
| 2.3 | ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම | |
| | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යාම සඳහා සභාපතිවරයා විසින් මාසික ප්‍රගති සමාලෝචන |

| | | |
|---|---|---|
| | අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබීම සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. | රැස්වීම් පවත්වන ලදී. එහෙත්, එහිදී ලබා ගන්නා ලද තීරණ, සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා දැනුවත් කිරීමට කටයුතු කර නැත. ඒ අනුව, 2020 වසරේ සිට මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර, අවශ්‍ය පියවර ගන්නා බව කාරුණිකව සදහන් කරමි. |

